සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | නර්තනය - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01 උඩරට නර්තන සම්ප්‍රදායේ 10වෙනි පාසරඹය හඳුන්වන්නේ ....................................................... අඩිය ලෙස ය.
(1) කරණම් (2) නුහුරු (3) තුන්පැති (4) චක්‍ර

02. හාවාගේ ගති ස්වභාවය ප්‍රස්තුතය ලෙස ගෙන ............................................................... වන්නම රචනාකර ඇත.
(1) සැවුලා (2) මුසලඩි (3) තුරඟා (4) සිංහරාජ

03. ශම නැමති ස්ථායි භාවය මුල්කොට ගෙන ............................................................................. රසය ජනිත වේ.
(1) හාස්‍ය (2) රෞද්‍ර (3) වීර (4) ශාන්ත

04. වීරත්වය, උත්සාහය පිළිබිඹුවන ආකාරයට ඉදිරිපත් කළ හැකි ගැමි නැටුමක් ලෙස .......................................... නැටුම හැඳින්විය හැකි ය.
(1) ගොයම් (2) කඩු (3) මෝල්ගස් (4) කුළු

05. "නෘත්‍යරත්නාකරය" කෘතිය රචනා කරන ලද්දේ ......................................................................... මහතා විසිනි.
(1) සී. ද එස්. කුලතිලක (2) මුදියන්සේ දිසානායක
(3) ජේ. ඊ. සේදරමන් (4) ජයසේන කෝට්ටෙගොඩ

06. "නිලුපුල් දිගැසී තන රණ කලසී" යන කවි පදය........................................................ සංදේශ කාව්‍යයට අයත් වේ.
(1) තිරස (2) මයුර (3) පරවි (4) සැළලිහිණි

07. අංග ප්‍රත්‍යාංග හා උපාංග පිළිවෙලින් .............................................................................. ලෙස දැක්විය හැකි ය.
(1) කඳ, බෙල්ල සහ හිස (2) දෙපා, දෑස් සහ තොල්
(3) දෑත්, හිස සහ බෙල්ල (4) හිස, බෙල්ල සහ දෑස්

08. මහා දාඨික මහා නාග රජු විසින් නැටුම් ගැයුම් වැයුම් සහිත ගිරිභණ්ඩ පූජාවක් සිදු කළ බව .......................... සඳහන් වේ.
(1) චූල වංශයේ (2) මහා වංශයේ (3) දීප වංශයේ (4) ථූපවංශයේ

09. වාද ගී ස්වරූපයෙන් හා විනෝදාස්වාදය මූලික කරගෙන ............................................ වන්නම් රචනා වී ඇත.
(1) උඩරට (2) නවතම (3) සබරගමු (4) සින්දු

10. තාලයේ වේගය ......................................................................................................... ලෙස හැඳින්වේ.
(1) ගතිය (2) මිතිය (3) ග්‍රහ (4) ලය

11. රනේ රුවසෙ වත රුවින් දිලේදෝ .... මෙම කවියෙහි දෙවෙනි පදය වනුයේ,

(1) රනේ බරණ ගත වට සරසා දෝ (2) රනේ ඔසරි පොට නෙරිය තබාදෝ

(3) රනේ දෙකොන විලි මෝල් ගෙනේදෝ (4) සත්දින දොසහැර දෙපා තබා දෝ

12. "චන්ද නම් යස තේජ කුංකම" යන පදයට හිමි සදෘස්මත් සංඛ්‍යාව.

(1) 12 කි. (2) 11 කි. (3) 16 කි. (4) 14 කි.

13. කෝලම් නාටකයේ මනමේ, කාපිරි, අන්ධභූත ... ලෙස රඟ දක්වන්නේ ........................................................ .

(1) මානුෂ චරිතය (2) අධිමානුෂ චරිතය (3) කතාපුවත්ය (4) සත්ව චරිතය

14. 

මෙම රූපයෙහි දැක්වෙන වාදන භාණ්ඩය,

(1) ඉලතාලම් ය.

(2) එඬැක්ක ය.

(3) චෙංගිලම් ය.

(4) කුම්භ ය.

15. ගොයම් හා කුළු නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් දෙකකි.

(1) අරිච්චෙට්ටු සහ සුලකු (2) චෙම්බු සහ කෝලාට්ටම්

(3) සුලකු සහ චෙම්බු (4) අරිච්චෙට්ටු සහ කුම්මි

16. ආතත, විතත හා ඝන වාද්‍ය භාණ්ඩ සඳහා නිවැරදි වරණය වන්නේ,

(1) ගැටබෙරය, තම්මැට්ටම හා බටනලාව (2) දෙවොල්බෙරය, දවුල හා තලිය

(3) දවුල, දඬුබෙරය හා තාලම්පොට (4) රබාන, දඬුබෙරය හා පන්තේරුව

17. ග්‍රහ අපලය, සත්පත්තිනි මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ශිල්පියා වන්නේ,

(1) ප්‍රේම කුමාර එපිටවෙල ය. (2) චිත්‍රසේන ය.

(3) පණීභාරත ය. (4) නිමල් වෙල්ගම ය.

18. කෝලම් රඟමඩලට පාත්‍රයන් පැමිණීමට පෙර මුවා වී සිටින සැරසිල්ලකි.

(1) නේපත්‍යාගාරය (2) වෙස් අත්ත (3) ගොරකා අත්ත (4) බුරුල්ල අත්ත

- 19 - 21 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| පේළිය | A | B | C |
|---|---|---|---|
| 1. | කාලපන්දම් ගස | දෙවොල් තොරණ | වංගෙඩිය |
| 2. | පොල්මල | වෙස්අත්ත | මල්බුලත් පුටුව |
| 3. | බුරුල්ල අතු | යක්ගෙය | අයිලය |

19. දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම දෙකෙහිම භාවිතාවන සැරසිල්ලක් දක්නට ලැබෙන්නේ,

(1) 2 පේළියේ A ය. (2) 3 පේළියේ B ය. (3) 1 පේළියේ A ය. (4) 3 පේළියේ C ය.

20 කොහොඹා කංකාරි ශාන්තිකර්මයට පමණක් ආවේණික සැරසිලි ඇත්තේ,

(1) 2 පේළියේ B හා C ය. (2) 3 පේළියේ B හා C ය.

(3) 1 පේළියේ B හා C ය. (4) 2 පේළියේ A හා B ය.

21. බලි ශාන්තිකර්මයේ සැරසිල්ලක් දක්නට ලැබෙන්නේ,

(1) 2 පේළියේ C ය. (2) 1 පේළියේ B ය. (3) 3 පේළියේ A ය. (4) 2 පේළියේ B ය.

22. කුඹිකතාව මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍ර නිර්මාණ ශිල්පියා වන්නේ,

(1)ටානියා බැරකෝමා ය. (2) අංජලිකා චිත්‍රසේන ය.

(3) රොබට් ජූලීන්හි ය. (4) මහේෂ් උමගලිය ය.

23. උඩරට, පහතරට හා සබරගමු ප්‍රධාන ශාන්තිකර්මවලට අයත් නර්තන අංග පිළිවෙලින්,

(1) යක්කැනුම, හත්පද හා යහන්දැක්ම වේ.

(2) කුවේණි අස්න, දුනුමාලප්පුව හා දේවකෝල්පාඩුව වේ.

(3) කෝල්පාඩුව, යහන්දැක්ම හා මුදුන්තාලය වේ.

(4) යක්තුන් පදය, තෙල්මෙ හා කෝල්පාඩුව වේ.

24. තුන්තිතේ තාලරූපය ප්‍රස්තාරකරණයේදී සංකේත වශයෙන් භාවිතා වනුයේ,

(1) ∧∧/ (2) ∧∧∧ (3) /∧∧ (4) ∧//

25. "තත් දිත් තොං නං" සතර බීජාක්ෂර වයන වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) ගැටබෙරය යි. (2) දෙවොල් බෙරය යි.

(3) දවුල යි. (4) උඩැක්කිය යි.

26. දෙවොල් මඩුවේ උපත් කථාව සම්බන්ධ චරිත ඇතුළත් වරණය වන්නේ,

(1) මලය රජු, කුවේණි හා උෟරා (2) රාහු අසුරේන්ද්‍රයා

(3) පඬුවස්දෙව් රජු, උෟරා හා ගෝනා (4) සේරමාන් රජු, ගෝනා හා මැඩියා

27. කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය පෙළපාලි පිළිවෙලින්,

(1) දෙවොල් ගොඩබැසීම, නයා යක්කම හා ඇත් බන්ධනය වේ.

(2) උෟරා යක්කම, අඹ විදමන හා පොත්කඩේ යක්කම වේ.

(3) ගුරුගේ මාලාව, දෙවොල් ගොඩබැසීම හා ගබඩා කොල්ලය වේ.

(4) අඹ විදමන, ඇත් බන්ධනය හා යක්කම් පහ වේ.

28. ලෙන්චිනා හා පරයා යන චරිත දක්නට ලැබෙන්නේ,

(1) නාඩගම් හා කෝලම්වලය (2) සොකරි හා නාඩගම්වලය

(3) කෝලම් හා සොකරිවලය (4) සොකරි හා කෝලම්වලය

29. වේදිකා සැරසිලි, විදුලි ආලෝකය, අංග රචනය ආදී අංග අයත් වන්නේ,

(1) ආහාර්ය අභිනයට ය. (2) වාචික අභිනයට ය.

(3) සාත්වික අභිනයට ය. (4) ආංගික අභිනයට ය.

30. අතීතයේ වන්දිභට්ටයින් විසින් ගායනා කරන ලද්දේ,

(1) වන්නම් ය. (2) හටන් කවි ය. (3) මාල කවි ය. (4) ප්‍රශස්ති ය.

31. තාක්කු තක්කුං තරිකිට තකුඳ තත්ජෙං ...... මෙම අඩව්ව නර්තනය කළ හැකි තාල රූපය,

(1) මාත්‍රා 2 + 3 ය. (2) මාත්‍රා 3 + 4 ය. (3) 2 + 4 ය. (4) මාත්‍රා 4 + 4 ය.

32. තුන් තිතේ තාලරූපයට නර්තනය කළ හැකි වට්ටමකි.

(1) දොංජිංත ගත දොංත වට්ටම (2) කුඳාන්ත ගතදොං වට්ටම

(3) කුඳ කුජිගත වට්ටම (4) ගො ගො ජිං ජිංගත වට්ටම.

33. උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් සුවිශේෂී වූ බෙර වාදන අවස්ථාවකි.

(1) මගුල් බෙර (2) පිං බෙර 3) අත්‍යා බෙර (4) වැඳුම් දත්

34. දොං ජිංත ගත දොංත බෙර පදය වාදනය කළ හැකි තාල රූපය වන්නේ,

(1) මාත්‍රා 3 + 4 ය. (2) මාත්‍රා 2 + 3 ය. (3) මාත්‍රා 3 + 3 ය. (4) මාත්‍රා 2 + 4 ය.

35. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන ශිල්පියෙකු හා ශිල්පිනියක දැක්වෙන වරණය වන්නේ,

(1) කේ. එස්. ප්‍රනාන්දු මහතා හා චන්ද්‍රලේඛා මහත්මිය.

(2) චිත්‍රසේන මහතා හා ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය.

(3) සිරිබෝහාමි මහතා හා රජිනි සෙල්වනායගම් මහත්මිය.

(4) පණිභාරත මහතා හා චන්ද්‍රලේඛා මහත්මිය.

36. වෙස් ඇඳුම් කට්ටලයේ නළලට හා පපුවට පළඳින ආභරණ වේ.

(1) නෙත්තිමාලය හා අවුල්හැරය (2) පායින්පත් හා ශිඛාබන්ධනය

(3) ජටාව හා තෝඩුපත් (4) නෙත්ති මාලය හා කෙමෙත්ත

37. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ගායනා සහිත නර්තන අංගයකි.

(1) යක්ඇනුම (2) කොහොඹා හැල්ල (3) ආවැන්දුම (4) යක්තුන් පදය

38. රුප්පා යකුන් හා වැදි යකුන් පුද ලබන ශාන්තිකර්මය වන්නේ,

(1) දෙවොල් මඩුව යි. (2) පහන් මඩුව යි.

(3) කොහොඹා කංකාරිය යි. (4) ගම්මඩුව යි.

39. උඩරට වන්නම් රචනා වූ යුගය හා එයට අනුග්‍රහය දැක්වූ රාජ්‍ය පාලකයා වන්නේ,

(1) මහනුවර යුගය :- කීර්ති ශ්‍රී රාජසිංහ රජු (2) පොළොන්නරු යුගය :- නිශ්ශංක මල්ල රජු

(3) කෝට්ටේ යුගය :- හතරවන පරාක්‍රමබාහු රජු (4) මහනුවර යුගය:-ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

40. තා ජිං තත් තත් ජිං තත් ජිං තත් තත් ...... මෙම අඩව්ව නර්තනය කරනුයේ,

(1) මාත්‍රා 2 + 3 තාලයට දොං ජිංත ගත දොංත වට්ටමේදී ය.

(2) මාත්‍රා 3 + 3 තාලයට වෛරොඩි වන්නමේදී ය.

(3) මාත්‍රා 2 + 2 + 4 තාලයට කුඳාංත ගත දොං වට්ටමේදී ය.

(4) මාත්‍රා 4 + 4 තාලයට සිංහරාජ වන්නමේදී ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | නර්තනය - II | කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) සියළුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(i) ශාන්තිකර්ම වලින් බැහැර වූ ශාස්ත්‍රිය නර්තන අංගයක් ලෙස .............................. හැඳින්විය හැකි ය.

(ii) සෑම කෝලම් කණ්ඩායමක් ම .................................................................................... නමින් හැඳින්වේ.

(iii) ගණිතාලංකාර බමුණු පඬිවරයා විසින් උඩරට වන්නම් දහඅට පිළිබඳ ව .............................................. නැමති ග්‍රන්ථය රචනා කර ඇත.

(iv) ලෝකයේ පැවැත්ම වෙනස් ආකාරයකින් ඉදිරිපත් කිරීමේ ශෛලිය .................................................... ලෙස භරතමුනිණි විසින් දක්වා ඇත.

(v) නර්තනය, චලනය මාධ්‍යය කොට ගන්නා සේම, සංගීතය ..................................... මාධ්‍යය කොට ගනී.

(vi) බලිශාන්තිකර්මයේදී තාල වාද්‍ය භාණ්ඩය ලෙස ........................................................... භාවිතා කරයි.

(vii) කතකලි අංග රචන ශිල්පියා හඳුන්වන්නේ ................................................................................ ලෙස ය.

(viii) පාසල්වල සෞන්දර්ය විෂය ඉගැන්වීම අනිවාර්ය වූයේ .......................................................... වර්ෂයේ ය.

$(1 \times 8 = 8)$

(ix) පහත දැක්වෙන ගීත අන්තර්ගත නාට්‍ය නම් කරන්න.

1. මෙම ගිම්හාන :- ...........................................................................................
2. හනික වරෙව් කොල්ලනේ :- ...........................................................................................

(x) කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා සහ අවශේෂ ගායකයා හඳුන්වන නාම දක්වන්න.

1. ප්‍රධාන ගායකයා :- ...........................................................................................
2. අවශේෂ ගායකයා :- ...........................................................................................

$(2 \times 2 = 4)$

(02) (i) පහත දැක්වෙන බෙර පදය සුළු මහ දෙතිතට ප්‍රස්ථාර කරන්න.

"දොං දොං ජිං ජිං ගජිගත" (ල.04)

(ii) පහත සඳහන් කවි පද මාත්‍රා 3 + 3 තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

"කොකුම් පාට කිතුලින් බත් වළඳ ඉඳුරට හිමිවන
අතින් රැගෙන සිරි වසකුත් තුරඟුන් නැගී ඉඹුල් විමන" (ල.04)

(iii) දොං ජිංත ගත දොංත වට්ටමේ පළමු අඩව්ව අදාල තිතට ප්‍රස්ථාර කරන්න. (ල.04)

(ලකුණු 4 × 3 = 12)

(03) පහත සඳහන් මාතෘකා ඇසුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. රාජ්‍ය පාලනය හා බැඳි වාදන අවස්ථා දෙකක්
ii. මෝල්ගස් කවි
iii. කෝලම් නාටක වෙස් මුහුණු
iv. අනාඝාතාත්මක ගායනා
v. ගීත නාට්‍ය

(ලකුණු 4 × 3 = 12)

(04) "දේශීය නර්තන සම්ප්‍රදායන් හි ශාන්තිකර්ම, පුරාවෘත්ත කථා, විවිධ වූ චාරිත්‍ර විධි සහ නාට්‍යමය අංග ලක්ෂණයන්ගෙන් ද පෝෂණය වී ඇත.

i. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ එන චාරිත්‍ර විධි දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.
ii. පහන්මඩු හෝ දෙවොල් මඩු ශාන්තිකර්මවල එන නාට්‍යමය අවස්ථාවක් නම්කර එහි සුවිශේෂත්වය පැහැදිලි කරන්න.
iii. දෙවොල්මඩු හා පහන් මඩු ශාන්තිකර්මයේ එන කතා පුවතින් සන්නිවේදනය කරන්නා වූ ආගමික පසුබිම හා සමාජ ආකල්ප විමසුමට ලක් කරන්න.

(ලකුණු 4 × 3 = 12)

(05) i. සොකරි හා කෝලම් නාටක ප්‍රචලිත ප්‍රදේශ දෙක බැගින් නම් කරන්න.
ii. කෝලම් නාටකයේ එන මානුෂ චරිත දෙකක් නම් කර, ඉන් එක් චරිතයක් නිරූපණය සඳහා නර්තනය, ගායනය යොදා ගෙන ඇති ආකාරය විස්තර කරන්න.
iii. සොකරි හා කෝලම් ගැමි නාටකවල සමානතා මෙන්ම අසමානතා ද දැකිය හැකි ය. ඒ පිළිබඳව විමසුමක යෙදෙන්න.

(ලකුණු 4 × 3 = 12)

(06)


A


B


C

i. "A" රූපයේ ඇති නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩ 04ක් නම් කරන්න.
ii. "B" රූප සටහනෙහි දැක්වෙන මුද්‍රා නාට්‍යය නම්කර එහි ආහාර්ය අභිනයේ සුවිශේෂතා පිළිබඳ විමසුමක් කරන්න.
iii. "C" රූපයේ දැක්වෙන ප්‍රසංග අංගය ඇසුරු කොටගෙන රූපවාහිනී නර්තන අංගවල තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 4 × 3 = 12)

(07) i. 1970න් පසු නර්තන කලාවේ අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවණතා දෙකක් ලියන්න.
ii. අංග රචනා විධික්‍රම දෙකක් පිළිබඳ විස්තර කරන්න.
iii. "නව නර්තන නිර්මාණ, නර්තන කලාවේ ප්‍රගමනයට ඉවහල් වී ඇත" විමසන්න.

(ලකුණු 4 × 3 = 12)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**11 ශ්‍රේණිය**

# නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

| ක්‍රියාකාරකම | ප්‍රශ්න හා අපේක්ෂිත ප්‍රතිචාර |
|---|---|
| ක්‍රියාකාරකම 1<br><br><br><br>වාදනය හා ගායනය | (අ) ගායනය<br>i. කැමති ගායනයක් (ලකුණු 05)<br>ii. පහත සඳහන් භාණ්ඩ අතුරෙන් එකක් තෝරාගෙන ගායනය (කුසපත් ඇදීමෙන් තෝරා ගැනීමට සලසන්න.) (ලකුණු 05)<br>A කලගෙඩි කවි/ රබන් කවි/ ඔංචිලි වාරම්<br>B හටන් කවි/ කුලු කවි/ නමස්කාර ගායනාවක්<br>C පන්තේරු කවි/ ලී කෙලි කවි/ ගොයම් කවි<br>D ග්‍රහපන්ති කවි/ චාමර කවි/ ප්‍රශස්ති ගායනා<br>(ආ) වාදනය<br>i. කැමති බෙර සරඹයක් තාල තබා කීම, මධ්‍යලයට වාදනය කිරීම. (ලකුණු 05)<br>ii. කැමති බෙර පදයක් තාල තබා කීම, මධ්‍යලයට වාදනය කිරීම. (ලකුණු 05) |
| ක්‍රියාකාරකම 2 | (1) 6 - 12 දක්වා සරඹ අතුරෙන් කුසපත් ඇදීමෙන් එක් සරඹයක් තෝරා මධ්‍යලයට නර්තනය කිරීම කස්තිරම සමග<br>**නිර්ණායක**<br>i. නිවැරදි අංගහාර හා සාම්ප්‍රදායික ලක්ෂණ (ලකුණු 05)<br>ii. ශරීර චලන හැසිරවීම (ලකුණු 05)<br>iii. තාල වාදනයට අනුකූලව නර්තනය ඉදිරිපත් කිරීම (ලකුණු 05)<br>iv. කස්තිරම ඉදිරිපත් කිරීම (ලකුණු 05) |
| ක්‍රියාකාරකම 3 | පහත සඳහන් කාණ්ඩ අතුරෙන් කුසපත් ඇදීමෙන් තෝරාගෙන වන්නම සම්පූර්ණයෙන් නර්තනය කිරීම<br>A තුරඟා වන්නම / සිංහරාජ වන්නම<br>B සැවුලා වන්නම / හනුමා වන්නම<br>C වෛරොඩි වන්නම / මුසලඩි වන්නම<br>**නිර්ණායක**<br>i. ගායන කුසලතා ප්‍රදර්ශනය (ලකුණු 05)<br>ii. පද නර්තනය (ලකුණු 05)<br>iii. කස්තිරම, සීරුවාරුව (ලකුණු 05)<br>iv. අඩව්ව (ලකුණු 05) |

| | |
|---|---|
| ක්‍රියාකාරකම 4 | පහත සඳහන් කාණ්ඩ අතුරෙන් ගැමි නැටුමක් ඉදිරිපත් කරන්න.<br>(කුසපත් ඇදීමෙන්)<br>A කුලු / රබන් / කඩු<br>B චාමර / කඩු / කලගෙඩි<br>C ලී කෙළි / තාලම් / රබන්<br>D සවරන් / කුලු / කලගෙඩි<br>නිර්ණායක<br>i. උචිත චලනය (ලකුණු 05)<br>ii. රංග උපකරණ හැසිරවීම (ලකුණු 05)<br>iii. අවකාශ භාවිතය (ලකුණු 05)<br>iv. ඉදිරිපත් කිරීම (ලකුණු 05) |
| ක්‍රියාකාරකම 5 | පහත සඳහන් කාණ්ඩ අතුරෙන් කුසපත් ඇදීමෙන් එකක් තෝරා නර්තන මාධ්‍යයෙන් නිරූපණය කරන්න.<br>A මල් නෙලමින් ප්‍රීතිවන කුමාරිකාවක් / පැණි උරමින් යන සමනළයෙකු මකුළු දැලක පැටලීම<br>B කුනාටුවකට හසුවන ධීවරයෙක්/ ගොදුරක් සොයා යන උකුස්සෙක්<br>C පටාචාරාට දරුවන් අහිමි වීම / සතුටට පත් මොණරෙක්<br>නිර්ණායක<br>i. චරිත ස්වභාවය හඳුනා ගැනීම, භාව ප්‍රකාශනය (ලකුණු 05)<br>ii. සිද්ධි ගොඩනැගීම (ලකුණු 05)<br>iii. උචිත චලන (ලකුණු 05)<br>iv. අවකාශය භාවිතය හා ඉදිරිපත් කිරීම (ලකුණු 05) |
| | මුළු ලකුණු 100 |

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (3) 02. (2) 03. (4) 04. (2) 05. (3) 06. (1) 07. (4) 08. (2) 09. (3) 10. (4)

11. (1) 12. (4) 13. (3) 14. (2) 15. (1) 16. (4) 17. (3) 18. (2) 19. (3) 20. (2)

21. (1) 22. (4) 23. (3) 24. (1) 25. (2) 26. (4) 27. (2) 28. (3) 29. (1) 30. (4)

31. (2) 32. (2) 33. (3) 34. (2) 35. (4) 36. (1) 37. (2) 38. (3) 39. (4) 40. (1)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)

## II කොටස

(01) (i) වන්නම් (ල. 01) (ii) කෝලම් කුට්ටම (ල. 01) (iii) නෛර්ත මාලය (ල. 01)

(iv) නාට්‍ය ධර්මී (ල. 01) (v) ශබ්ද හා නාද (ල. 01) (vi) අත්මිණිය (ල. 01)

(vii) පත්තු කාරන් (ල. 01) (viii) 1972 (ල. 01)

(ix) අ. විදුර නුර්ති නාට්‍යය ආ. බෙරහඬ නාට්‍යය (ල. 02)

(x) අ. පොන්නාහි ආ. සිංකිඩි (ල. 02)

1 - 8 = ල. 08 යි
9 - 10 - ල. 2 × 2 = 4
ල. 12

(02) (i)

| ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග |ත |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු = 02
බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු = 02 (මුළු ලකුණු 04)

(ii)

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කො | කුම් | - | පා | - | ට | කි | තු | ලින් | - | බත් | - |
| ව | ළ | දා | - | ඉ | ඳු | ර | ට | හි | මි | ව | න |
| අ | තින් | - | රැ | ගෙ | න | සි | රි | ව | ස | කුත් | - |
| තු | ර | ගුන් | - | නැ | ගි | ඉ | ඹුල් | - | වි | ම | න |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු = 02
කවි පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු = 02 (මුළු ලකුණු 04)

(iii)

| ^ | | / | | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| තත් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| තත් | කඩ | තක් | කඩ | කුඳ | ත | ක | රොං | - | - |
| ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ද |
| කි | ටි | ත | ක | ට | කුං | - | දත් | - | - |
| ජි | ක | රොං | | | | | | | |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු = 02
අඩව්ව නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු = 02 (මුළු ලකුණු 04)

(03) (i)
- අණ බෙර
- රණ බෙර
- වද බෙර ... ආදී අවස්ථා පිළිබ,ව ලියා ඇත්නම්

(ii) මෝල්ගස් කවි
- මෑතකදී නිර්මාණය වී ඇත.
- ශාන්තිකර්මවල එන අටමගලේ කවි යොදාගෙන ඇත.
- මෝල්ගස්වල ස්වභාවය කවි වලින් කියැවේ.
- ප්‍රසංග වේදිකාව සඳහා ද යොදා ගනී
- මුල් වරට මෝල්ගස් නැටුම නිර්මාණය කළේ මිරැන්ඩා හේමලතා මහත්මිය විසිනි.
- උදාහරණ ලෙස කවිද ලිවිය යුතුයි.

(iii)
- වෙස් මුහුණු සඳහා භාවිතාවන ලී වර්ග නම් කිරීම (වෙල් කදුරු, ගොඩ කදුරු, රුක්අත්තන)
- වෙස් මුහුණු පළඳින චරිත නම් කිරීම (අණබෙර, නොංචි, ජසයා, මුදලි .... වැනි)
- වෙස් මුහුණු පැළඳීමට හේතු ලියා ඇත්නම් (චරිතය සුවිශේෂී කිරීමට, චරිත ලක්ෂණ මනාව උද්දීපනයට, හාස්‍ය රසය මතු කිරීමට, විවිධත්වයක් ඇති කිරීමට ....)

(iv)
- තාලය තැබිය නොහැකි බව.
- පැල්, පතල්, පාරු, ගැල් වැනි උදාහරණ තිබීම
- රිද්මයානුකූල ගති ලක්ෂණ තිබීම.

(v)
- කතා තේමාව, ගීත, කවි වැනි ගායනා තුළින් දිග හැරීම
- සංගීතය හා ගායනාවන් ප්‍රබල වීම.
- තාලානුකූල, රිද්මානුකූල දෙබස් හා සංවාද පැවතීම
- දෙපානෝ ...වැනි උදාහරණ ලියා තිබීම.
- නළුවා විසින්ම ගීත ගායනා කිරීම.

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(04) (i) කප් සිටුවීම, තොට පේ කිරීම, මඩු පේ කිරීම, අයිලෙ යැදීම ආදී විධි තුළින් 02ක් නම්කර ඇත්නම් ලකුණු 02 කෙටියෙන් හඳුන්වා ඇත්නම් ලකුණු 02යි.

(ii) අඹ විදමන, දෙවාල් ගොඩ බැසීම, ඉන් එකක් නම්කර ඇත්නම් ලකුණු 01

<u>අඹ විදමන</u>

- පත්තිනි දේවිය අඹෙන් උපන් කථාව නිරූපණය කරන බව
- මහළු වේශයකින් එම චරිත නිරූපණය කරන බව
- බෙර වාදන සමග කවි ගායනා, දෙබස් හා සංවාද භාවිතා කරන බව
- හාස්‍ය රසය හා වීර රසය ඉන් පිලිබිඹුවන බව

<u>දෙවොල් ගොඩබැසීම</u>

- දෙවොල් දෙවියන් ලංකාවට පැමිණීම අනුකරණාත්මකව රංගනයේ දෙනෙ බව
- කවි ගායනා හා නර්තන භාවිතාවන බව
- දෙවොල් ඇඳුම් කට්ටලයෙන් සැරසී ඉදිරිපත් කරන බව
- නොපිට හරවන වචන, හාස්‍ය රසය මුසුවන දෙබස් හා සංවාද සිදුකෙරෙන බව ... ආදී ලෙස කරුණු 03ක් ලියා ඇත්නම් ලකුණු 03

(iii)
- පංචශීලය සහ ආගමික සංකල්පය ඇසුරින් පුරාවෘත්තය හා බැඳි සිද්ධිය විස්තරකර ඇත්නම්
- ක්‍රෝධය, වෛරය, සත්ත්ව හිංසනය, ශාපය වැනි ප්‍රතිවිපාක කර්මානුකූලව සිදුවන බව ආදී කරුණු අනුව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු 04

(05) (i) සොකරිː-
වන්නි, බදුල්ල, හඟුරන්කෙත, මාතලේ, කොටුවේගොඩකොනකලගල .... ආදී අදාළ ප්‍රදේශ දෙකක් ලිවීමට ලකුණු 02
කෝලම්ː-
අම්බලන්ගොඩ, ඇල්පිටිය, බෙන්තර, මාතර, හොරණ, ගම්පහ ආදී අදාළ ප්‍රදේශ දෙකක් ලිවීමට ලකුණු 02

(ii) මානුෂ චරිතː-
- ජසයා, ලෙන්චිනා, මුදලි, නොංචි, පොලිස්, අණබෙර, මරක්කල, හෙංචා, ලියනාරච්චි ... ආදී චරිත දෙකක් නම් කිරීමට ලකුණු 01
- ඉන් එක් චරිතයක් නර්තන, ගායන, ඇසුරින් කරුණු තුනකින් වත් විස්තර කිරීමට ලකුණු 03යි.

(iii) සමානතා
- අරමුණුː- පුජාර්ථය, සශ්‍රීකත්වය, විනෝදාස්වාදය අරමුණු වී ඇති බව
- සියළුම චරිත පිරිමින් විසින් රඟ දක්වන බව
- ඇතැම් අවස්ථාවලදී චරිත උපහාසයට ද ලක්වන බව
- රඟමඩලට පිවිසීමේදී ගායනා මගින් චරිත හඳුන්වා දීම හා ගමන් තාල භාවිතා කරන බව
- දෙබස්, සංවාද, ගායනා, වාදන අන්තර්ගත බව

අසමානතාː-

| සොකරි | කෝලම් |
|---|---|
| • උඩරට සම්ප්‍රදාය | • පහතරට සම්ප්‍රදාය |
| • ගැටබෙරය, උඩැක්කිය, දවුල | • පහතරට බෙරය, හොරණෑව |
| • සරළ බෙරපද භාවිතය | • ශාස්ත්‍රීය(සංකීර්ණ) බෙරපද භාවිතය |
| • සරළ වෙස්මුහුණු | • සංකීර්ණ වෙස්මුහුණු |
| • එක් කථා පුවතක් | • කථා පුවත් කිහිපයක් |

ආදී වශයෙන් සමාන ලක්ෂණ දෙකක් හා අසමාන ලක්ෂණ දෙකක් ඇසුරින් කරුණු විස්තර කිරීමට ලකුණු04

(06) (i)
- චෙන්ඩා, මද්දලම්, චඩක්ක, එලතාලම්, චෙංගිලම්, කුම්භ ආදී වාද්‍ය භාණ්ඩ 4ක් නම් කිරීමට ලකුණු 04

(ii) B කරදිය ලකුණු 01
- වේදිකා සැරසිලි, විදුලි ආලෝකය, රංග වස්ත්‍රාභරණ සුවිශේෂතා කරුණු 3ක් මගින් විස්තර කිරීමට ලකුණු 03

(iii)
- අධිවේගී / මන්දවේගී දර්ශන
- සමීප - දුරස්ථ දර්ශන
- ප්‍රතිබිම්බ නිර්මාණය
- ගායනය, වාදනය තාක්ෂණික උපාය මාර්ග වලින් හඬ පාලනය හා සුසර කිරීම
- අවශ්‍ය රූපය පමණක් ඉස්මතු කොට පසුබිම ඉවත්කිරීම
- ආලෝකකරණය

ඉහත කරුණු 4ක් ඇසුරින් පිළිතුරු ලියා විස්තර කර ඇත්නම් ලකුණු 04

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(07) (i)
- 1972 රජයේ පාසල්වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වීම.
- 1972 ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලය ආරම්භ වීම.
- 1978 අ.පො.ස. (උ.පෙළ.) සඳහා නර්තනය විෂයයක් වශයෙන් ඇතුලත් වීම.
- 1974 කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ සෞන්දර්ය අධ්‍යයන ආයතනය ආරම්භ වීම.
- 2005 සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය පිහිටුවීම.

අදාල කරුණු දෙකක් ලියා ඇත්නම් (ලකුණු 04)

(ii)
- ස්වාභාවික අංග රචනය
- චරිතාංග අංගරචනය
- ශෛලිගත අංගරචනය
- විකාරරූපී අංගරචනය

පිළිතුරු දෙකක් ලියා විස්තර කර තිබීම (ලකුණු 04)

(iii)
- නර්තන කලාව සඳහා පෙර අපර දෙදිග ශිල්පීය ක්‍රම යොදා ගැනීම (භාරතීය හා බටහිර)
- තාක්ෂණික දියුණුව නිසා නර්තන කලාව තුළ ඇති වූ ප්‍රබෝධය පිළිබඳව
- පෙර අපර දෙදිග ආභාෂය අනුව විචිත්‍ර වූ රංගවස්ත්‍රාභරණ භාවිතය
- අන්තර්ජාතික සබඳතා නර්තන කලාවේ ප්‍රගමනයට හේතු වූ බව

ආදී අදාල කරුණු හතරක් විස්තර කිරීමට (ලකුණු 04) (මුළු ලකුණු 12)